# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

## මහජන ආරක්ෂක අමාත්‍යාංශය

## විශේෂ කාර්ය බලකාය

## (ශ්‍රී ලංකා පොලීසිය)

# ලංසු ආරාධනයයි (IFB)

## ශ්‍රී ලංකා පොලීසිය විශේෂ කාර්ය බලකාය එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරි සඳහා පපු ආවරණ 201 ක් මිලදී ගැනීම.

**ලංසු අංකය : PS/03/PB/PR/08/36/2024**

01. සභාපති, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව, මහජන ආරක්ෂක අමාත්‍යාංශය, 18 වන මහල, "සුහුරුපාය", බත්තරමුල්ල, ශ්‍රී ලංකාව විසින් පහත සඳහන් භාණ්ඩ සැපයීම සඳහා සුදුසුකම්ලත් හා අවශ්‍යතා සපුරා ඇති ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

| අනු.අ | ප්‍රසම්පාදන අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය | ලංසු පෝරම ගාස්තුව | ලංසු ඇපකරයේ වටිනාකම රු. |
|---|---|---|---|---|---|
| 1 | PS/03/PB/PR/08/36/2024 | Body Armors | 201 | 15,500.00 | 1,050,000.00 |

02. ලංසු කැඳවීම ජාතික තරඟකාරී ලංසු ක්‍රමය යටතේ සිදු කරනු ලබයි.

03. මේ පිළිබඳව උනන්දුවක් දක්වන සුදුසුකම් සපුරා ඇති ලංසුකරුවන්හට වැඩි විස්තර, ප්‍රධාන ගණකාධිකාරී, මහජන ආරක්ෂක අමාත්‍යාංශය, වෙතින් **දුරකථන අංක - 0112 887697 / විද්‍යුත් ලිපිනය** mops.procurementunit@gmail.com මගින් ලබා ගැනීමටද, ප්‍රසිද්ධ හා බැංකු නිවාඩු දින හැර සතියේ දින වලදී 2024.07.26 **දින සිට** 2024.08.15 වන දින දක්වා **පෙ.ව 9.00 සිට ප.ව 3.00** අතර කාලයේ දී මූල්‍ය අංශය, මහජන ආරක්ෂක අමාත්‍යාංශය, 17 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල හිදී හෝ අපගේ නිල වෙබ් අඩවියෙන් **(www.pubsec.gov.lk)** ගාස්තු රහිතව ලංසු ලිපි ලේඛන පරීක්ෂා කල හැකිය.

04. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතා සපුරන ලද සියලුම ලංසුකරුවන්ට, අදාල භාණ්ඩ සැපයීමට නෛතික අයිතිය තිබිය යුතුය. ලංසුකරු තම ආයතනය ව්‍යාපාරයක් වශයෙන් ලියාපදිංචි කර තිබිය යුතු අතර, ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන ලංසුවේ වටිනාකම රු. මිලියන 05 ට වැඩිනම් 1987 අංක 3 දරණ පොදු කොන්ත්‍රාත් පනත යටතේ (Public Contract Act) ලියාපදිංචි වී තිබිය යුතුය. මෙම ලියාපදිංචි සහතිකය ලංසුව සමග ඉදිරිපත් නොකිරීම ලංසුව ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වනු ඇත. ලංසුකරුගේ නම රජයේ අසාධු ලේඛන ගත නොවිය යුතු ය. අමතර විස්තර ලංසු ලිපි ලේඛනවල සපයා ඇත.

05. පහත සඳහන් ලිපිනයට ලිඛිත අයදුම්පතක් ඉදිරිපත්කර මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද ලංසු ලිපි ලේඛන කට්ටලයක් ආපසු නොගෙවනු ලබන රුපියල් පහළොස් දහස් පනසියයක **(රු.15,500.00)** ලංසු පෝරම ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් 2024.07.26 **දින සිට** 2024.08.15 වන දින දක්වා රජයේ වැඩ කරන දිනයන්හි **පෙ.ව 9.00 සිට ප.ව 3.00** දක්වා කාලය තුළ ලබාගත හැක. එක් ආයතනයක් සඳහා එක් ලංසුවකට එක් ලංසු පෝරමයක් පමණක් නිකුත් කරනු ලැබේ.

06. ලංසු පිටපත් දෙකක් සහිතව, ලංසුව **2024.08.16 දින ප.ව 2.00 ට** හෝ ඊට පෙර 17 වන මහල, "සුහුරුපාය", බත්තරමුල්ල, මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ මූල්‍ය අංශයේ තබා ඇති ලංසු බහාලනු ලබන ලංසු පෙට්ටියට බහාලීම හෝ ලංසුව විවෘත කරනු ලබන වේලාවට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයේ වම් කෙලවර ඉහළ ලංසු අංකය පැහැදිලිව සටහන් කර තිබිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද පෞද්ගලිකව පැමිණ සිටීමට රිසි ලංසුකරුවන් හෝ ඔහුගේ නියෝජිතයින් ඉදිරිපිටදී 17 වන මහල, "සුහුරුපාය", බත්තරමුල්ල, මහජන ආරක්ෂක අමාත්‍යාංශයේදී **2024.08.16 වන දින ප.ව 2.00 ට** අදාල ලංසු විවෘත කරනු ලැබේ. ලංසු භාර ගැනීම අවසාන වූ වහාම එම අවස්ථාවට සහභාගි වීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන් හෝ ඔහුගේ නියෝජිතයින් ඉදිරිපිටදී ලංසු විවෘත කරනු ලැබේ.

07. ඉදිරිපත් කරනු ලබන ලංසුවල වලංගු කාලය **2024.08.16 දින සිට 2024.11.15** දක්වා විය යුතුය. (ලංසු විවෘත කරන දින සිට අවම වශයෙන් දින 91).

08. සියලුම ලංසු, රුපියල් දස ලක්ෂ පනස් දහසක (රු.1,050,000.00) ඇපකරයක් සමග ඉදිරිපත් කළ යුතු අතර, ඉදිරිපත් කරනු ලබන ඇපකරය පහත කොන්දේසි යටතේ විය යුතුය.
    - i. මූල්‍ය සමාගමක් වශයෙන් මහ බැංකුවේ ලියාපදිංචි ආයතනයක් වෙතින් ලබාගත් ඇපකරයක් විය යුතුය.
    - ii. ලංසු ඇපකර ආකෘති පත්‍රය ලංසු පෝරම කට්ටලයේ IV වන කොටසේ ඇතුලත් පෝරමය පරිදි විය යුතුය.
    - iii. ලංසු ඇපකරය ලේකම්, මහජන ආරක්ෂක අමාත්‍යාංශය "Secretary-Ministry of Public Security" නමින් විය යුතුය.
    - iv. ලංසු ඇපකරයේ වලංගු කාලය **2024.08.16 දින සිට 2024.12.13 දින දක්වා** විය යුතුය. (ලංසු විවෘත කල දින සිට දින 119)

09. **2024.08.02 වන දින පෙ.ව 10.30 ට** ශ්‍රවණාගාරය, මහජන ආරක්ෂක අමාත්‍යාංශය, 17 වන මහල, "සුහුරුපාය", බත්තරමුල්ල හිදී පූර්ව ලංසු රැස්වීමක් පැවැත්වෙනු ඇත.

10. කලින් කලට වෙනස් වන මුදල් රෙගුලාසි සහ භාණ්ඩාගාරයේ උපදෙස් චක්‍රලේඛයන්ට අදාලව අවශ්‍ය සංශෝධනයන් එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළදී සිදු කිරීම ප්‍රසම්පාදන කමිටුව මගින් සිදුකළ හැකි අතර, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසන් තීරණය ලෙසට සැලකිය යුතුය.

11. පහත සඳහන් ලිපිනය මගින් හෝ දුරකථන අංක මගින් මේ සම්බන්ධව වැඩිදුර විමසීම් සිදුකළ හැක.

| ලිපිනය | දුරකථන අංක | |
|---|---|---|
| ප්‍රධාන ගණකාධිකාරී, | සෘජු දුරකථන අංකය | 011 - 288 7697 |
| 17 වන මහල, "සුහුරුපාය", | පොදු දුරකථන අංක | 011 - 288 6067 |
| බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | ෆැක්ස් අංකය | 011 - 288 7784 |

**සභාපති,**
**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,**
**මහජන ආරක්ෂක අමාත්‍යාංශය,**
**18 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.**